**ශීර්ෂය 311 -ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

-------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

--------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලැබී තිබූ දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබූ අනුරාධපුර මල්වතු ඔය තිඹිරිකඩවල ඉඩමේ වටිනාකම රු.92,000,000 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි. | 2022 මැයි 28 දින නිවැරදි කර ඇත. | දෙපාර්තමේන්තුවට හිමිකම් ඇති වත්කම් පමණක් ගිණුම් ගතකළ යුතුය. |

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර ඇත. මු.රෙ 502 (2) ප්‍රකාරව 287 ආකෘතියට වත්කම් සකස් කිරීමට සටහන් කර ගෙන ඇත. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි පරිදි වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි | වාහන සම්බන්ධ ලොග් පොත් සියල්ල 2022 මැයි 30 වන විට යාවත්කාලීන කර ඇත.. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය කමිටුවේ ලේකම්වරයා විසින් පවත්වා නොතිබුණි. | 2021 දී මගහැරී ඇත. ඉදිරියේදී පවත්වාගෙන යනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iv) මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අදාල මූල්‍ය වගකීම් සඳහා නිලධාරින්ට අදාල වන ඇප ප්‍රකාශ හා ඇප තැබිය යුතු ආකාරය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | මු.රෙ.891 ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොළොන්නරුව සංචාරක බංගලාවේ නවාතැන් ගැනීම් වෙනුවෙන් වසර 1 - වසර 5 අතර කාලයක සිට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දෙපාර්තමේන්තුවට අයවීමට තිබූ රු.343,800 ක හිඟ හිටි ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | ලිපි 06 ක් මගින් ජනාධිපති ලේකම් දැනුවත් කර ඇතත් මෙතෙක් ගෙවීම් සිදුකර නැත. | නිවාඩු නිකේතනවල නවාතැන් දීමට පෙර ගාස්තු අයකර ගත යුතු අතර නැවත නවාතැන් දීමට පෙර හිඟ මුදල් අයකර ගතයුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.එසේ වුවද වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ එකතුව රු.9,900,000 ක මුදලින් සියයට 34 සිට සියයට 100 දක්වා වූ පරාසයක එකතුව රු.4,434,305 වෙනත් වැය විෂයයන් වෙත වර්ෂය තුළ මාරුකර තිබුණි. | අනපේක්ෂිත ඇතිවූ වාහන 03 ක අළුත්වැඩියාවන් නිසා මෙසේ මාරු කිරීමට සිදුවූ අතර විදේශ ගමන් නොමැති වීමත් රාජකාරි ගමන් සීමාවීම නිසා වාහන නඩත්තුව අවමවීමත් නිසා එම වැය විෂයයන් හි ඉතිරිවීම් සිදුවිය. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පවතින තත්ත්වයන් පිළිබඳ සැලක්ල්ලට ගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

**2.3 සීමා ඉක්මවීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරන ලද අත්තිකාරම් අවම ලැබීම් සීමාව රු.8,300,000 ක් වූ අතර තථ්‍ය අත්තිකාරම් ලැබීම් වටිනාකම | අදාල සංශෝධනය සඳහා ජාතික අයවැය දෙපාර්තමේනේතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් 2021 දෙසැම්බර් 31 දින යවා ඇත. | අනුමත සීමාවන් සඳහා ලඟාවීමට නොහැකිනම් ඒ සඳහා නියමිත දිනට පෙර අනුමැතිය ගැනීමේ නීතිමය |

| | | | |
|---|---|---|---|
| | රු.6,587,149 ක් වූයෙන් රු.1,712,851 කින් අවම සීමාවට ලගා නොවීම නිරීක්ෂණය විය. | | අවශ්‍යතාවයට අනුගත විය යුතුය. |
| (ආ) | 2019 ජූනි 17 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ආ) වගන්තියේ උපදෙස් පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණය ශේෂ කඩිනමින් නිරවුල් කරවා ගතයුතු වුවද , 2021 අප්‍රේල් 01 දින සිට අධිකරණ අමාත්‍යාංශයට ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.203,200 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | 2022 පෙබරවාරි ගිණුම් සාරාංශ මගින් නිරවුල් කර ඇත. | නිරවුල් නොවූ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජූනි 17 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ආ) වගන්තියේ උපදෙස් පරිදි විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් අයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කර කඩිනමින් නිරවුල් කරවා ගැනීම කළයුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින සිට 2021 සැප්තැම්බර් 21 අතර කාලය තුළ විශ්‍රාම ගිය, විශ්‍රාම පාර්තෝෂිකය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති නිලධාරින් 05 දෙනෙකුගේ එකතුව රු.654,905 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.175,190 ක ණය ශේෂ 2022 පෙබරවාරි මාසයේදී අයකර ගැනීමට කටයුතු කර ඇත. | විශ්‍රාම යන නිලධාරීන්ගේ ණය ශේෂ පාරිතෝෂිතයෙන් අයකර ගත යුතු වේ. |
| (ඈ) | 2019 ජූනි 17 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ඉ) වගන්තියේ උපදෙස් හා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කර තනතුර හැරගිය නිලධාරින්ගේ ණය ශේෂ කඩිනමින් නිරවුල් කරගත යුතු වුවත් නිලධාරීන් 03 දෙනෙකුට අදාල එකතුව රු. 202,175 ක් වසර 02 ත් වසර 25ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන හෝ නිරවුල් කර නොතිබුණි. | එකතුව රු.30,000 ක් වූ නිලධාරින් දෙදෙනෙකුගේ ණය ශේෂ පොත්වලින් කපා හැරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. අනික් ණය ශේෂය අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.4 බැරකම් වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේදී වැය කළ එකතුව රු.667,858 ක් වූ වවුචර් පත් 24 ක වටිනාකම 2021 වර්ෂයට අදාළ බැරකම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හැකිතාක් ගෙවීමට ඇති බැරකම් හදුනාගෙන ඇතුළත් කර ඇත. | බැරකම් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගතකල යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | 273,000 | රෙගුලාසියේ 612 අධිකාරිය යටතේ රජයේ මුදල් , ආදායම බඩු බාහිරාදිය භාරව සිටින පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එසේ කටයුතු පවරා ඇති නිලධාරින් විසින් ඇප තැබීම සිදුකල යුතු වුවත් නිලධාරින් 36 දෙනෙකු විසින් ඇප තැන්පත් කිරීම සිදුකර නොතිබුණි. | නිලධාරීන්ට අදාල ඇප ප්‍රමාණය හා ආකාරය සම්බන්ධ ලිපිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරන අමාත්‍යාංශ ලේකම්ගේ 2001/08/22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | | දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් වසර 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇතිනම් වෙනත් ස්ථානයට ස්ථාන මාරු කිරීමට කටයුතුකළ යුතු වුවත් නිලධාරීන් 31 | වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති ඒකාබද්ධ සේවයේ නිලධාරීන් ස්ථාන මාරුවීම් දත්ත පද්ධතියට (misco) යාවත්කාලීන කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සම්බන්ධයෙන් එපරිද්දේන් කටයුතු කර නොතිබූ අතර ඔවුන්ගේ සේවාකාලය අවුරුදු 06 ත් 33 ත් අතර පැවතුණි. | |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය සහ මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා මාණ්ඩලික නිලධාරී විසින් තම කාර්යය නිමකර දින 10 ක් තුළ පියවිය යුතු වුවත් අවස්ථා 04 කදී එකතුව රු.131,790 ක් වටිනාකම් ඇති අතුරු අග්‍රිම දින 29-125 ත් අතර කාලයක් ප්‍රමාද වී නිරවුල් කර තිබුණි. | ඉදිරියේදී මෙම තත්ත්වය අවම කර නිසි පරිදි අත්තිකාරම් පියවීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ආ) දෙපාර්තමේන්තුවේ නිලධාරින් 05 ක ගෙන් අයවිය යුතු එකතුව රු. 475,350 ක් වූ අත්තිකාරම් ශේෂයක් 2021 දෙසැම්බර් 31 දිනට පැවති අතර එම ශේෂය තුළ වසර 05 ක සිට පැවත එන රු.80,000 ක අත්තිකාරම් ශේෂයක් ද පැවතුණි. | අත්තිකාරම් පියවීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.7 අයවිය යුතු ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයේ නියුතුව සිට බැදුම්කරයකට අත්සන් තබා වැටුප් රහිතව නිවාඩු ලබාගෙන විදේශ ගතව සිටි කාලය තුළ එනම් 2015 අගෝස්තු 14 දින රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වූ සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) වරයකු විසින් බැදුම්කරයේ කොන්දේසි කඩකිරීම හේතු කරගෙන දෙපාර්තමේන්තුවට අයවීමට තිබූ රු.610,782 ක් අයකර ගැනීමට මේ දක්වා ක්‍රියාකර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සුඛිත සුබල සුහුරු දැයක්, සුසැලි සුරැකි සොඳුරු බිමක් වූ අතර මෙහෙවර වූයේ ජාතික භෞතික සැළසුම් ප්‍රතිපත්තීන් , සැළසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ ගොඩබිම සහ එහි මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සාමාජීය පොදු හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කලාපීය හා ප්‍රාදේශීය සැළසුම මගින් එම ජාතික ප්‍රතිපත්තිය හා සැළසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම හා පාලනය කිරීම වේ. එසේ වුවද මෙහෙවරෙන් බැහැරව පූජාභූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයින් 115 දෙනෙකු අඛණ්ඩව යොදවා තිබුණි. ඒ හේතුවෙන් එම කටයුතු අධීක්ෂණයට කාලය සහ ශ්‍රමය යෙදවීමට දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණි. තවද දෙපාර්තමේන්තුවේ අරමුණු නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | 2019 වර්ෂයේදී ජාතික භෞතික සැලැස්ම 2020 ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු ආරම්භ කර ඇත. | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමුකර ඒවා ලගාකර ගැනීමට හැකිවන පරිදි සුදුසු සැලැස්මක් දෙපාර්තමේන්තුවට සකස් කර ගත යුතුය. |

### 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 07 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කර 2022 ජනවාරි 31 දින වන විට අවසන් කළ යුතු වුවත් 2022 මාර්තු 31 වන විටත් එය අවසන් කර නොතිබුණි. 2021 වර්ෂයේදී භෞතික සැළසුම් කටයුතු සඳහා රු.1,240,938 ක් වැයකර තිබුණි. | 2019 ජූනි ජාතික භෞතික සැලැස්ම ගැසට් මගින් ප්‍රකාශයට පත්කර තිබූ අතර එය යාවත්කාලීන කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නගර නිර්මාණ ශිල්පියෙකුගේ උපදේශන සේවය ලබාගත් අතර ඊට අදාල සිතියම් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත පවරන ලදී | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අනුරාධපුර පූජා භූමිය තුළ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2016 ආරම්භ කර 2017 වර්ෂයේ සිට 2021 දක්වා එකතුව රු.මිලියන 634.7 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 13.41 ක් එනම් සියටට 2.1 ක් පමණක් වසර 05 ක් තුළ වියදම් කර තිබුණි. මේ සඳහා 2017 ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම, ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම සහ ඉඩමේ මායිම සලකුණු කිරීම පමණක් සිදුකර තිබුණි. මෙහිදී පූජා භූමිය ආශ්‍රිත පදිංචි කරුවන් ලෝලුගස්වැව නගරයට සංක්‍රමණය කරවීම සම්බන්ධයෙන් පැවති සමාජීය ගැටළු පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. එහෙයින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ලගාකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘති සඳහා වූ ඉඩම නිදහස් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2021 ජුනි දක්වා ප්‍රමාද කිරීම නිසා ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු නියමිත කාලය තුළ සිදුකර ගැනීමට උපරිමව කටයුතු කර ඒ අනුව ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘති නිසිකලට ක්‍රියාත්මක කළ යුතුවේ. |
| (ඇ) නැගෙනහිර, ඌව, උතුරු යන පළාත්වල කලාපීය භෞතික සැළසුම් 03 ක් සකස් කිරීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද මෙම සැලසුම් සකස් කර නොතිබුණි. | කලාපීය සැලසුම් සකස් කිරීම පිළිබඳ උපදෙස් මාලා යාවත්කාලීන කර මූලික කටයුතු ආරම්භ කර ඇතත් කොරෝනා තත්ත්වය හමුවේ එම කටයුතු සිදුකළ නොහැකි විය. | රටේ අවශ්‍යතාවය හා දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට උපරිමව කටයුතු කල යුතුය. |

3.3 **අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතන වලින් ලබාදුන් ප්‍රාදේශීය භෞතික සැලසුම් (කුඩා නගර හෝ සේවා මධ්‍යස්ථාන) 20 කින් 13 ක සැලසුම් සකස් කිරීම වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබූ අතර දෙපාර්තමේන්තුව විසින් සැලසුම් 03ක් පමණක් සකස් කිරීම අවසන් කර | පැවති කොරෝනා වසංගතය හේතුවෙන් සේවා මධ්‍යස්ථාන 09 ක් සඳහා සැලසුම් සකස් කිරීමට තීරණය කරන ලදී. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන භෞතික සැලසුම් සකසා නියමිත දිනට ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබූ අතර සැලසුම් 04 ක් සකස් කරමින් පැවතුණි. | | |
| (ආ) පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේනම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ මහා විහාර 10 ක් පූජා භූමි ලෙස ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර විහාර 07 ක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර තිබූ නමුත් වර්ෂය තුළ ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර තිබුනේ කුරුණෑගල මැද්දෙපොළ රජමහා විහාරය පමණි. | ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම එම භූමිවල සහතික කරන ලද මිනින්දෝරු සැළසුම් සහ එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම් සිදුකළ යුතුය. එම කටයුතු ප්‍රමාදවීම නිසා ගැසට් මගින් පූජා භූමි ප්‍රකාශයට පත්කිරීම ප්‍රමාද විය | දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා දැක්ම අනුව සැකසූ අපේක්ෂිත කාර්යන් නියමිත කාලය තුළ නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදනය**

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.මිලියන 7.3 ක මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මට අනුව වැයකර තිබුනේ රු.මිලියන 4.78 ක් වන අතර 2021 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබූ එකතුව රු.මිලියන 3.29 ක් වූ අයිතම 8 කට අදාලව ප්‍රසම්පාදනයන් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණි. | ප්‍රමුඛතාවයන් ලබා දිය යුතු කාර්යයන් හඳුනා ගැනීම නිසා එම කාර්යයන් සිදුකරන ලදි. | ප්‍රමුඛතාවය ඇති කාර්යයන් නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) අනුව ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු කැඳවීම් ලේඛන වර්ග පිළිබඳ එකගවීම සඳහා ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටු ඒකාබද්ධ රැස්වීමක් පැවත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ රු.7,300,000 ක ප්‍රසම්පාදන කටයුතුත සඳහා එසේ කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු ඒකාබද්ධව රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාල සීමාවකට පසුව හෝ කි.මී.25,000 ක ධාවනය කිරීමෙන් අනතුරුව හෝ සිදුකරනු ලබන අළුත්වැඩියාවකදී හෝ යන කාරණා 03 න් පළමු වන අවස්ථාවේදී ඉන්ධන පරීක්ෂාව සිදුකළ යුතු වුවත් වාහන 04 ක් සඳහා 2014 න් පසුවත් තවත් වාහන 04 ක් සඳහා 2019 න් පසුවත් අනික් වාහන 06 සඳහා 2020 න් පසුවත් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | 2021 වාහන 05 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර ඇත. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තුවේ වාහනවල ඒ ඒ මාසයේ ධාවන සටහන් පත්‍ර හා ධාවන සාරාංශ නිසි පරිදි සකස්කර මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව අදාල මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දින ගතවීමට පෙර වාහන භාර නිලධාරියාගේ අත්සනින් විගණනය වෙත එවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. | දෝෂය නිවැරදි කර ගැනීමට සටහන් කර ගන්නා ලදී. | වාහන ධාවන සටහන් හා සාරාංශ විගණනයට නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් 2015 සිට ධාවනයට යොදාගෙන නොතිබූ අතර වාහන 05 ක ආදායම් බලපත්‍ර ලබා ගැනීමට මාස 06 සිට මාස 91 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදවීම් නිරීක්ෂණය විය. | ධාවන තත්ත්වයට පත්කර ගැනීමෙන් පසු බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | දඩ නොගෙවන පරිදි නියමිත කාලය තුළ වාහන බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) දෙපාර්තමේන්තුව මගින් 2017 වර්ෂයේ කුලී සින්නක්කර පදනම මත ලබාගත් රු.31,750,000 ක් වටිනා වාහන 05 ක් දෙපාර්තමේන්තුවේ අයිතියට පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | නියමිත කාලය තුළ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) දෙපාර්තමේන්තුව විසින් වාහන 04 ක එන්ජින් අළුත්වැඩියාවක් සඳහා රු. 2,940,390 ක් වැයකර තිබූ අතර එකී වියදම් මූලධන ප්‍රාග්ධනිත වැය විෂයය යටතේ දරා තිබූ නමුත් එම වියදම වාහනවල වටිනාකමට එකතුකර ප්‍රාග්ධනිත කර වත්කම් පිළිබඳ භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ (කොම්ප්ට්‍රෝල් ජනරාල් වෙත ) වාර්තාවේ හෝ වාහන ලේඛනයට හෝ ඇතුළත් කර නොතිබුණි. | අතපසුවීමකින් වාහන ලේඛනයට ඇතුළත් වී නැත. නිවැරදි කිරීම් කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවමි. | වත්කම් ලේඛන තුළ නිවැරදිව වටිනාකම් සටහන් කළ යුතුය. |
| (ඊ) පහත සඳහන් දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල අයිතීන් පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකිරීමට ක්‍රියාකර නොතිබුණි.<br><br>**ඉඩම පිහිටි ස්ථානය** ---------------------- / **වත්කම් ක්ෂේත්‍ර අංකය** -------------------------<br>කතරගම ඔසු උය ඉඩම — 6113124<br>කතරගම විශ්‍රාම ශා ඉඩම — 6113124<br>කතරගම සංචාර බංගලා ඉඩම සහ කතරගම ඉඩම — 6141101 | අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් සමග සාකච්ඡා කිරීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවට අයිති ඉඩම් පවරා ගෙන ගිණුම්ගත කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ බංගලා භාරකරුවකු 2020 වර්ෂයේදී කූඨ ලිපිලේඛන සකස් කර මුදල් අවභාවිතා කර තිබුණි. ඒ සම්බන්ධයෙන් ආයතන මට්ටමේ පරීක්ෂණයක් පමණක් සිදුකර තිබුණද එය අවසන් කර නොතිබුණි. | එම නිලධාරියා පදිංචි ස්ථානය සොයා ගැනීමට උත්සාහ කරමින් සිටි. | නිසි පරිදි පරීක්ෂණ කඩිනමින් පවත්වා තීරණයක් ගත යුතුය. |
| (ආ) 2019, 2020 වර්ෂවලදී කතරගම විශ්‍රාම ශාලා 2 අළුත්වැඩියා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.89,609,700 ක් වැයකර තිබූ නමුත් 2019, 2020, හා 2021 යන වර්ෂවල උපයාගෙන තිබූ ආදායම් පිළිවෙලින් රු.383,900, රු.86,900 හා රු.10,450 ක් පමණක් විය.. | කොවිඩ් වසංගතය හේතුවෙන් 2019 සිට ආදායම අඩුවී ඇත. | අවම වශයෙන් වියදමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගතහැකි පරිදි හෝ වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ) දෙපාර්තමේන්තුව සතු බත්තරමුල්ල දියවන්නා උද්‍යාන මාවතේ පිහිටි 2015 වර්ෂයේදී රු.5,160,000 කට මිලදී ගත් අංක 104 දරන නිල නිවස, 2017 වර්ෂයේ සිට සේවකයින්ට ලබාදී නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ වෙනත් අවශ්‍යතාවයකට යෙදවීමට කටයුතු නොකොට නිශ්කාර්යව වත්කමක් ලෙස පවත්වා ගෙන ගොස් තිබුණි | එම කාලය තුළ නිල නිවාස සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවූ අතර ඉදිරියේදී නිසි පරිදි වෙන්කර දීමට හැකිවනු ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සැළසුම් සකස් කර දීම වෙනුවෙන් රාජ්‍ය ආයතන වලින් දෙපාර්තමේන්තුව ගාස්තු අය කරනු නොලබන නමුත් උඩුබද්ධාව උප නගරය සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කර දීමට 2018 ඔක්තෝබර් 31 දින රු.180,000 ක ඇස්තමේන්තුවක් එම ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර 2019 පෙබරවාරි 08 දින එයින් අත්තිකාරමක් වශයෙන් රු.68,000 ක් ලබාගෙන තිබුණි. මෙම සැලැස්ම සකස් කිරීමේ කාල සීමාව 2018 දෙසැම්බර් සිට 2019 මාර්තු යනුවෙන් ඇස්තමේන්තුවේ දක්වා තිබුණද 2022 ජුනි 17 වන විටත් සැලැස්ම සකස් කර නොතිබූ අතර ප්‍රාදේශීය සභාවෙන් අයකරගත් රු.68,000 ක මුදල පොදු තැන්පතු වල රඳවා තබාගෙන පසුව රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | අදහස් දක්වා නැත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන නගර සැලසුම් සකස් කිරීමට පොදුවේ පවතින ක්‍රමවේදයට කටයුතු නොකිරීම හා එම කාර්යයන් නියමිත දිනට සිදු නොකිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) මූලධන වැය විෂයය අංක 311-1-1-0-02-2506 යටතේ යටිතල පහසුකම් සංවර්ධනයට වෙන්කල රු.205,200,000 ක මුදලින් රු. 202,607,846 ක් එනම් සියයට 98.74 ක්ම සංවර්ධන කටයුතු සඳහා වැය නොකර වර්ෂ අවසානයේ ඉතිරි කර තිබුණි. | ලෝලුගස්වැව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | ආයතනයේ මූලික අරමුණු ඉටුකිරීමට ක්‍රියාත්මක කළයුතු කාර්යයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන වැය කර එම කාර්යයන් නියමිත දිනට ඉටු කළ යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------- | ------------ |
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2014 පෙබරවාරි 07 දිනැති DMS /1 117 දරන ලිපිය මගින් පූජා භූමි වල සේවය සඳහා වැඩ පරීක්ෂක තනතුරු 10 ක්ද මුරකරුවන් 14 ක් සහ කම්කරු 91 ක් හා තනතුර දරන්නාට පෞද්ගලික වනසේ වූ තනතුරු 115 ට අමතරව 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 283 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 158 ක්ද පුරප්පාඩු 125 ක් ද විය. එනම් විධායක ශ්‍රේණියේ අනුමත තනතුරු 51 න් තනතුරු 41 ක් පුරප්පාඩුව පැවතුණි. මෙය අනුමත සංඛ්‍යාවෙන් සියයට 80 ක ප්‍රතිශතයක් විය. තවද අනුමත මුලු සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සියයට 44 ක ඉහළ ප්‍රතිශතයක් විය. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීමට නොහැකිවී තිබුණු අතර ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නගර නිර්මාණ ශිල්පියෙකුගේ උපදේශන සේවාවක්ද ඊට අදාල සිතියම් සකස් කිරීම තවත් පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමට සහ අනුමත වන ජාතික භෞතික සැළැස්ම ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන දැනුවත් කිරීමට තොරතුරු වාර්තාවක් සැකසීමට සැලසිනෝ ආයතනය වෙත පැවරීමටද තීරණය කර තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන හා බොහෝ කාර්යයන් දෙපාර්තමේන්තුවෙන් බාහිර | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීමට අත්‍යාවශ්‍යම පුරප්පාඩු නියමිත කාලය තුල පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ශවයන් ලවා කරවා ගනු ලබන බවත් නිරීක්ෂණය විය. | | |
| (ආ) | ආයතන සංග්‍රහයේ 13.3 ට පටහැනිව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2017 ජූලි 03 දින සිට වසර 04 ක්ද සහකාර අධ්‍යක්ෂක තනතුරු 02 ක් 2015 නොවැම්බර් 30 දින සිට වර්ෂ 06 ක් අඛණ්ඩව වැඩ බැලීමට පත්කර තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | වැඩ බැලීම් පත්වීම් ආයතන සංග්‍රහයට අනුව මාස 02 ක් තුළ පිරවීමටත් ආයතනයේ කාර්යසාධනයට බලපාන මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමත් කළ යුතුය. |